IHP
INSTITUTE FOR HEALTH POLICY

72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 මැයි 18
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 12:01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# 2023 අප්‍රේල් මාසයේදී ධනාත්මක ශුද්ධ හිතකර ශ්‍රේණිගත කිරීමක් ඇති එකම ප්‍රධාන පක්ෂ නායකයා අනුර කුමාර දිසානායක වේ.

*අනෙකුත් පක්ෂ නායකයින් පිළිබඳව මහජනතාව දිගින් දිගටම අහිතකර මතයක් දරයි.*

නවතම ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයේ (SLOTS) ජා.ජ.බ./ජ.වි.පෙ නායක අනුර කුමාර දිසානායකගේ හිතකර දර්ශකය ක්‍රම ක්‍රමයෙන් වර්ධනය වෙමින්, +7 හි ශුද්ධ ධනාත්මක සමස්තයක් බවට පත්ව ඇත. ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ හිතකරත්වය මාර්තු මාසයේ -68 සිට අප්‍රේල් මාසයේදී -39 දක්වා ලකුණු 29 කින් වැඩි විය. කෙසේ වෙතත්, මහජනතාව ස.ජ.බ. නායක සජිත් ප්‍රේමදාසට වඩා ජනාධිපති කෙරෙහි දිගින් දිගටම අහිතකර මතයක් දැරූ අතර ඔහුගේ හිතකර ශ්‍රේණිගත කිරීම් අගය සුළු වශයෙන් වෙනස් විය (මාර්තු -31 සිට අප්‍රේල් -26 දක්වා). දිගින් දිගටම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා කෙරෙහි (-94) වැඩිම සෘණාත්මක ශ්‍රේණිගත කිරීම පවත්වා ගෙන ගොස් තිබේ.



එක් එක් මාසය සඳහා හිතකර ඇස්තමේන්තු පදනම් වන්නේ එම මාසය තුළ සහ ඊට පෙර සහ පසු සති කිහිපයක් තුළදී අවම ප්‍රතිචාර කට්ටලයක් සහතික කිරීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 100-400ක් මතය. 2023 අප්‍රේල් ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ 383 (සජිත් ප්‍රේමදාස), 311 (අනුර කුමාර දිසානායක), 388 (රනිල් වික්‍රමසිංහ) සහ 139 (ගෝඨාභය රාජපක්ෂ) සම්මුඛ සාකච්ඡා මත ය.

**සංස්කාරකවරුන්ට සටහන**

ඇතැම් විට මහජනතාව මාධ්‍ය විසින් වාර්තා කරන මෙම සංඛ්‍යා වරදවා වටහා ගන්නා බව අපිට අවබෝධ විය. සෘණ ලකුණු, එනම්, ශුන්‍යයට වඩා අඩු සමස්ත හිතකරත්ව ශ්‍රේණිගත කිරීමකින් අදහස් වන්නේ පුද්ගලයා හෝ ආයතනය කෙරෙහි හිතකර මතයක් නොපවතින බවයි. ධනාත්මක ලකුණු පමණක්, එනම්, ශුන්‍යයට වඩා වැඩි සමස්ත හිතකරත්වයකින් අදහස් වන්නේ එම පුද්ගලයා හෝ ආයතනය කෙරෙහි හිතකර මතයක් පවතින බවයි.

**අදාළ වාර්තා**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මාර්තු, "ශ්‍රී ලාංකිකයන් සියලු දේශපාලන පක්ෂ නායකයින් සම්බන්ධයෙන් දිගින් දිගටම අහිතකර අදහස් දරයි. බොහෝ පුද්ගලයන්ට ප්‍රංශ ජනාධිපති මැක්‍රොන්ට වඩා අඩු හිතකරත්වයක් ඇති අතර, සුළු ධනාත්මක ශ්‍රේණිගත කිරීමක් ඇත්තේ ස්වල්ප දෙනෙකුට පමණි." https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230328.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 පෙබරවාරි, "2022 වර්ෂය අවසන් වන විට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා කෙරෙහි, ඔහුගේ පූර්වගාමියාට වඩා වැඩි හිතකරත්වයක් තිබූ නමුත් මහජනතාව සියලු පක්ෂ නායකයින් කෙරෙහි අහිතකර මතයක් දරනු ලබයි." https://www.ihp.lk/news/pres_doc/IHPPressRelease20230208.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ආයතනයල 2022 අප්‍රේල් ",SLOTS හිතකර ශ්‍රේණිගත කිරීම: මහජන හිතකරත්වය මැනීමේ ක්‍රමවේදය". SLOTS වාර්තාව #2022-03. https://ihp.lk/publications/docs/SLOTSReport202203.pdf යෙන් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් සමීක්ෂණයට භාජනය කරනු ලැබේ. ප්‍රසිද්ධ පුද්ගලයෙක් හෝ ආයතනයක් පිලිබඳව හිතකර හෝ අහිතකර මතයක් තිබේ දැයි ප්‍රතිචාර දැක්වූවන්ගෙන් විමසීමෙන් SLOTS ශුද්ධ හිතකරත්වය ගණනය කරනු ලබයි: ශුද්ධ හිතකරත්වය යනු ධනාත්මක (+100) සහ සෘණාත්මක(-100) ප්‍රතිචාරවල සාමාන්‍යය වේ. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අංශය, පළාත භාවිතයෙන් ජාතික ජනගහනයට ගැළපෙන පරිදි සියලුම ඇස්තමේන්තු නැවත සකස් කර ඇත. මාසික ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ සෑම මාසයක් තුළ සහ ඊට පෙර සහ පසු සති කිහිපයක සිදු කරන ලද සම්මුඛ පරීක්ෂණ 100+ ක නියැදියක් මත ය.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.